**ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනය - 2017**

**------------------------------------------------------------**

ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ ('ආයතනය') 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සාමාජිකයන්ගේ අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනතේ 31 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 2.1 තත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම්

------------------------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන කාලසීමාවට අදාළ ආදායම සහ වියදම පමණක් ගිණුම්ගත කළ යුතු වුවද, එයට පටහැනිව පසුගිය වර්ෂයකට අදාල උසාවි ගාස්තු රු.27,750 ක් වන මුදලක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා තිබුණි.

(ආ) ස්ථාවර තැන්පතු සඳහා 2017 දෙසැම්බර් 31 දිනට වූ පොලී ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.2 නොසැසඳු වෙනස්කම්

----------------------------

විගණනයට ඉදිරිපත් කළ උපලේඛන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සම්මන්ත්‍රණ, සමුළු සහ සේවාවන්ගෙන් ලද ආදායම රු.1,517,500 ක් විය. කෙසේ වෙතත්, උක්ත ආදායම් අයිතමයන් රු.1,563,425 ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ හෙයින් රු.45,925 ක වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.

හේතුවක් නොදක්වමින් තම සාමාජිකයන් බැංකු ගිණුමට තැන්පත් සිදුකිරීම නිසා ඍජු තැන්පතු හඳුනාගැනීමේ දුෂ්කරතාවය උක්ත වෙනසට හේතු විය හැකි බව ආයතනයේ සභාපති විසින් විගණනය වෙත දන්වා තිබුණි.

### 2.2.3 ලැබිය යුතු ගිණුම්

-------------------------

2015 වර්ෂයේ සිට ටයි පටි විකිණීම වෙනුවෙන් සාමාජිකයන්ගෙන් අයවිය යුතු රු.48,000 ක මුදලක් මෙම වාර්තාවේ දිනය දක්වාම අය නොවී පැවතුණි.

## 2.3 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනත | |
| (i) 10 (2) වගන්තිය | සභාවේ රැස්වීමක් සඳහා සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත සනපූරනයක් පැවතිය යුතුය. එහෙත් 2017 අප්‍රේල් 03 දින සාමාජිකයන් 09 දෙනෙකුගෙන් පමණක් සමන්විත රැස්වීමක් පවත්වා තිබුණි. |
| (ii) 10 (9) වගන්තිය | සභාව විසින් සියළුම රැස්වීම්වලට අදාලව ලුහුඩු වාර්තා ඒ සඳහා ඇති පොතේ සටහන් කල යුතු අතර පසුව පැවැත්වෙන රැස්වීමේ මූලසුන දරන සාමාජිකයා විසින් එම වාර්තාවල සිය අත්සන යෙදිය යුතුය. එසේ අත්සන යෙදූ වාර්තා එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් පිළිගත හැකි සේ සැලකිය යුතුය. එහෙත් 2017 වර්ෂයේ අප්‍රේල් 03 සහ මැයි 15 දින පැවැත්වූ රැස්වීම් දෙකක් සම්බන්ධයෙන් එසේ ලුහුඩු වාර්තා සකස් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| - මුදල් රෙගුලාසි 454 (1) සහ 502 (2) | භාණ්ඩ ලේඛන පොත සහ ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි පවත්වා ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් රු. 1,340,202 ක අතිරික්තයක් ජනිත වී තිබූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 675,695 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 664,507 ක වර්ධනයක් දක්නට ලැබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂය තුලදී පරිපාලන සහ මෙහෙයුම් වියදම් පහල යාම උක්ත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 අගය එකතු කිරීම සම්බන්ධයෙන් ආයතනයේ දායකත්වය

විගණනයට ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සිදුකල විශ්ලේෂණයට අනුව, පුද්ගල පඩිනඩි සහ ක්ෂය සඳහා ගිණුම්වලින් කළ අය කිරීම් සැලකීමේදී සමාලෝචිත වර්ෂය සඳහා අගය එකතු කිරීමේ වටිනාකම රු.1,640,002 බව අනාවරණය විය.

එමෙන්ම පසුගිය වර්ෂය සඳහා එම අගය රු.970,970 ක් විය. එහෙයින් අගය එකතු කිරීම සම්බන්ධයෙන් රු.669,032 ක වර්ධනයක් නිරීක්ෂණය විය. එහෙත් 2015 වර්ෂයේ අගය එකතුවේ වටිනාකම වූ රු. 1,225,678 ට සාපේක්ෂව 2016 වර්ෂයේ එම අගය රු.254,708 කින් අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනතේ 04 වගන්තියේ සඳහන් මූලික අරමුණු වූ එහි සාමාජිකයන් වෙත ශිෂ්‍යත්ව, මූල්‍යාධාර, ශිෂ්‍යාධාර, තිළිණ හා අනෙකුත් ත්‍යාගයන් ප්‍රදානය කිරීම ඉටු කිරීමට ආයතනය අසමත් වී තිබුණි.

### 4.2 නිශ්ක්‍රිය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත වත්කම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව සංචලනය නොවන සහ සෙමින් සංචලනය වන පිළිවෙලින් රු.92,276 ක් සහ රු.131,100 ක් වටිනා ඉන්වෙන්ට්‍රි අයිතම 2015 වර්ෂයේ සිට පැවතුණි.

(ආ) බැංකු ජංගම ගිණුමක තිබූ රු.33,479 ක ශේෂයක් 2016 වර්ෂයේ සිටම අභාවිතව පැවතුණු අතර බැංකු ගාස්තු ලෙස රු.5,250 ක මුදලක් මෙම ජංගම ගිණුමෙන් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

### 4.3 අනාර්ථික ගනුදෙනු

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ මූලික වැඩ සඳහා දරන ලද රු. 342,400 ක මුදලක් 2009 වර්ෂයේ සිට කෙරී ගෙන යන වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එහෙත්, බදු ගිවිසුම අවලංගු කිරීමටත්, මූලික වැඩ ඉටු කරන ලද ඉඩම පවරාගෙන එම කර්තව්‍ය සඳහා වෙනත් ඉඩමක් පවරා දිමටත් නාගරික සංවර්ධන අධිකාරිය තීරණය කර තිබුණි. එබැවින් මූලික වැඩ සඳහා වැයකරන ලද මුදල අනාර්ථික වියදමක් බවට පත්වී තිබුණි.

*මෙම මුදල ලියාහැරීම සඳහා සභා පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස සභාව විසින් භාණ්ඩාගාරික වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ බව ආයතනයේ සභාපති විසින් විගණනය වෙත දැනුම්දී තිබුණි.*

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය ඇස්තමේන්තුව

අනාගත ක්‍රියාකාරකම් පුරෝකථනය කිරීම සහ අපේක්ෂිත ඉලක්ක අත්පත් කර ගැනීම් සඳහා මාර්ගෝපදේශ සැපයීම සඳහා සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය ඇස්තමේන්තුව උපකාරී වුවද, 2017 වර්ෂය සඳහා ඒ කිසිවක් ආයතනය විසින් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. වියදම් ගිණුම් තැබීම පාලනය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.